දිවි තොර කරගැනීම් වැළැක්වීම අරමුණු කරගනිමින් දැනුවත් කිරීමේ ලිපි පළ කිරීමේදී වුව ද, හදිසි උපකාරක අංක පළ කිරීම යෝග්‍ය බව Ethics Eye අපි නිරතුරුවම මාධ්‍ය වෙත පෙන්වා දෙන්නෙමු.

ඒ අනුව, දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සම්බන්ධයෙන් අද පුවත්පතේ (අගෝස්තු 16, 2023) "සියදිවි නසා ගැනීම, වාර්තාකරණය කෙසේ විය යුතුද?" යන මැයෙන් ලිපියක් පළ වී තිබිණි.

පළමුකොටම, දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී මාධ්‍ය වගකීම, ආචාර ධාර්මිකව හා වගකීම් සහගතව දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සම්බන්ධයෙන් ලිපියක් පළ කිරීම කාලෝචිත සේම ප්‍රශංසා කටයුතු වෙයි.

නමුත්, දිවි තොර කරගැනීම් වාර්තාකරණය සම්බන්ධ මාධ්‍ය ආචාර ධර්ම පෙන්වා දෙන්නේ, දිවි තොර කරගන්නා ආකාරයන් නොදක්වන ලෙසටයි. එහෙත් මෙම ලිපිය සමඟින් දිවි තොර ගත හැකි ආකාරයක් දක්වන රූප සටහනක් පළ කර තිබිණි. එය මෙම ලිපියේ අපේක්ෂිත ප්‍රතිඵලයට පරස්පර විරෝධී වේ.

දිවි තොර කරගැනීම් පිළිබඳ වගකීම් සහගත වාර්තාකරණය මෙම ලිපියෙන් සාකච්ඡා වී තිබුණත්, හදිසි උපකාරක අංක සඳහන් වී නොමැත. මෙවැනි ලිපියක් සමඟින් වුවත් හදිසි උපකාරක අංක සඳහන් කිරීම අත්‍යවශ්‍ය වන්නේ, එයින් තවත් දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතය බේරා ගැනීමට අවකාශ සැලසෙන හෙයිනි.

වගකීම් සහගතව දිවි තොර කර ගැනීම් වාර්තා කිරීමු! ඒ සඳහා මාධ්‍ය මාර්ගෝපදේශයන් පිළිපදිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)